## අන්තර්ජාලයේ හබයක්

ඔබ අන්තර්ජාලයට සම්බන්ධ වන සෑම විටම අන්තර්ජාලයේ ඔබේ පරිගණකය පිහිටි ස්ථානය දැක්වෙන ලිපියක් ලැබෙනවා. මේ ලිපිනය අප හඳුන්වන්නේ ෂජ එඩ්‍රස් ලෙසයි. අප අන්තර්ජාල පහසුකම් ලබාගන්නා විට සමහර අන්තර්ජාල සේවා සපයන්නන් (Internet Service Providers) අපට ස්ථිර IP ලිපිනයක් දෙන අතර සමහර සේවා සපයන්නන් අපට දෙන්නේ අප අන්තර්ජාලයට සම්බන්ධව සිටින කාලයට පමණක් වලංගු තාවකාලික IP ලිපිනයක්.

මේ IP ලිපිනයේ නීතිමය තත්වය ගැන තීරනයකට එන්න යුරෝපයේ දත්ත ආරක්‍ෂාව පිළිබඳ නිලධාරීන් දැන් නීති සටනකට අවතීර්ණ වෙලා තියෙනවා. ඔවුනගේ තර්කය වන්නේ IP ලිපිනයක් පුද්ගලික දත්තයක් බැවින් එය ආරක්‍ෂා විය යුතු බවයි. පුද්ගලයෙක් IP ලිපිනයක් මගින් හඳුනාගත හැකි නම් එම IP ලිපිනය පුද්ගලික අයිතියට යටත් විය යුතු බවයි ඔවුන්ගේ අදහස.

පසුගිය අවුරුදු 10 ප්‍රථම යුරෝපා සංගමයේ IP ලිපිනය සැළකුවේ පුද්ගලික අයිතියට යටත් දෙයක් හැටියටයි. එම නිසා IP ලිපින දත්ත සුරැකීමේ නීතියට යටත් විය යුතුව තිබුණා.

නමුත් ගූගල් වැනි අනත්ර්ජාල සමාගම් ඉදිරිපත් කරන තර්කය මෙයට වෙනස්. ඔවුන් පවසන්නේ IP ලිපිනයක් ලැබෙන්නේ පුද්ගලයාට නොව ඔහු පාවිච්චි කරන පරිගණකයට බවයි. IP ලිපිනයෙන් හැඳින්වෙන්නේ පරිගණකය මිස එය ඉදිරියේ වාඩි වී සිටින පුදගලයා නොවන බැවින් IP ලිපිනය පුද්ගලික දත්තයක් ලෙස සැලකිය නොහැකි බවයි ඔවුන් තර්ක කරන්නේ.

පුද්ගලික සමාගමේ මේ තර්කය නිසා IP ලිපිනය පිළිබඳ නීතිමය අර්ථ දැක්වීමක් අත්‍යවශ්‍ය බව දැන් වැටහිලා. IP ලිපිනයක් හෙළිදරව් වීම එම IP ලිපිනය අයිති පුද්ගලයාගේ පුද්ගලිකත්වයට හානියක් දැයි පරීක්‍ෂා කර අදාල නීති සකසන්න දැන් යුරෝපා පාර්ලිමේන්තුව සූදානම් වෙනවා. - සමාගම් මොන තර්ක ගෙනාවත් මිනිසුන්ගේ පුද්ගලිකත්වයට හානි වීම වැළැක්විය යුතුයි." යුරෝපා සංගමයේ නිලධාරීන් කියන්නේ එහෙමයි.




## චීනයේ අන්තාර්ජාලයේ පෙරටම

වසර 2007 අවසන් වන විට චීනයේ අන්තාර්ජාල සැරිසරන්නන්ගේ සංඛ්‍යාව මිලියන 210 ඉක්මවා ගියා. ලෝකයේ වැඩිම අන්තර්ජාල සැරිසරන්නන් සිටින රට බවට චීනය ඉතා ඉක්මනින්ම පත්වෙන බවට ලකුණු දැන් පහළවෙලා.

වැඩිම අන්තර්ජාල සරන්නන් සිටින ඇමරිකා එක්සත් ජනපදයට වඩා මිලියන පහක් පසුපසිනුයි දැනට චීනය සිටින්නේ. 2008 වසරේදී ඇමරිකාව පසුකර යන්නට චීනයට හැකිවන බව ස්ථිරයි.

එපමණක් නොවෙයි. 2007 නොවැම්බර් මාසය වන විට ලෝකයේ වැඩිම ජංගම දුරකථන පාවිච්චි කරන්නන් සිටින රට බවට චීනය පත් වුණා. මිලියන 539.4 ක් චීනයේ ජංගම දුරකථන පාවිච්චි කරනවා. 2007 වසරේදී පමණක් චීනයේ මිලියන 73ක් අලුතින් අන්තර්ජාලය පාවිච්චි කරන්න පටන් ගත්තා. ගම්බද අන්තර්ජාල පාවිච්චි කරන සංඛ්‍යාව 2006 වසරට වඩා 127.7% පහුගිය වසරේදී වැඩි වී තිබෙනවා.

මේ විශාල පරිවර්තනය චීනයේ සමාජයට කෙසේ බලපායිද යන පැනය දැන් එරටේ රජයට ඇතිවෙලා තිබෙනවා. මේ නිසාම අලුතින් නීති සම්පාදනය කරන්නත් සිදුව තිබෙනවා. චීනයේ අන්තර්ජාලයට සම්බන්ධ අලුත්ම නීතිය දෙසැම්බර් මාසයේදී එළි දැක්වුණා. ඒ අනුව රජයේ පාලනයෙන් පිටත ඇති කිසිම ආයතනයකට රූප සහ හඬ ඇතුලත් වෙබ් අඩවි පවත්වාගෙන යන්න අවසර නැහැ.

තාක්‍ෂණය හා පාලනය අතර සටනින් ජය ගන්නේ කවුද ?

ජගත්




33 පිටෙන්

වතාවක්නං කැඩුවද. කොලුවාගේ දඩබ්බර කම් ජේන්නෝනාගේ දයානුකම්පාවන් මාරුවෙන් මාරුවට ආවර්ජනය වෙද්දී බුරම්පි ඉතිරි ටිකත් කියන්ට පටන් ගත්තේ කටේ පිරී තිබූ බුලත් කෙල ටික මිදුලේ මුල්ලකට පහත්වී හිස්කර ගැනීමෙන් පසුය.
"ඔය සල්ලි අරං...... මිනිහ ගිහින් ඇලහැර මැණික් ගරන්න, ඒකත් ඉවර කරගෙන ආයිත් ඔය ඇවිත් ඉන්නෙ..........."
තුෂ්ණීම්භූතව හිස් අහස දෙස බලාගෙන සෑහෙන වෙලාවක් ගතකල හාමිනේ "ම්............., ඒකයි ජේන්නෝන මේ පැත්තෙ ආවෙගියෙ නැත්තෙ" තමාටම කියා ගත්තාය. ජේන්නෝනා තම නෙත නොගැටීමට හේතුව ලොකුහාමිනේ නිසැකවම දැනගත්තා විනා බුරම්පිගේ ගතු කීමෙන් සිද්ධ වූ අන් කිසිවක් නැත.
වියපත්වන විට ලබන ප්‍රඥාව නිසා හෝ ජීවිතයේ අත්දැකීම් නිසා හෝ මෙවන් අකටයුතු හමුවේ නොසැලෙන මිනිසුන් සිටිය හැකිද?, ඒ ඉතා කලාතුරකිණි. ඔවුන් සසරේ දස පාරමිතා පුරන බෝසතුන් විය නොහැකිද? මෙවන් මිනිසුන්ගේ සෙවණ හෝ ඇසුර ලබන්නෝ සඳ දියෙහි නැහැවෙන කුමුදු සේ සුව පහස විඳින්නෝ නොවන්නේද?

-----------

"දැං මොකද ජේන්නෝනො තිලක කරන්නෙ?"
තම පුතු වුවත් මෙවන් අසමජ්ජාති වැඩක් කළ පව්කාරයකු ගැන මෙසේ නොවිමසා හතරමායිමේ පස් පාගන්න එපායැයි තමා පන්නා ගත්තේ නම් සිතට සහනයක් නොවේදැයි ජේන්නෝනාට කල්පනා වෙත්ම දෑසට කඳුළු උනන්නට පටන් ගත්තේය. ඇය පිළිතුරු දෙනවා වෙනුවට ලොකුහාමිනේගෙන් මුහුණ සඟවන්නට ඉදලත් ඇදගෙන මිදුලේ ඈත කෙළවරට ගැටුවාය.
එම පැණයට පිළිතුරු ලැබුනේ වේදනාවන් සමනය වී ලොකුහාමිනේට තේ කෝප්පයක් පිරිනමා තමන්ද කුස්සියේ ලොයි බංකුවේ වාඩිවී කහට කෝප්පයක් බොන අතරතුරේය.

"ඔය ඉන්නෙ රස්තියාදු ගගහ, නල්ලමලේ යාළුවො ටිකකුත් දැන් ලෑස්ති කරගෙන. මට බය කසිප්පු පොලකට එහෙම පුරුදු වෙයිද කියල හාමිනේ, ලොකු එකීටත් ඔන්න ඔය ඒ ඉස්කෝලෙම උගන්නන මහත්තෙක් මනාපෙං ඉන්නව කියල ආරංචියක් තියනව, මට බය මේක එකිගෙ මූනෙත් දැළිගාන තැනට වැඩ සිද්ද කරයිද කියල, මම හිත හොඳකින් ඉන්නව නෙවෙයි හාමිනේ............"
"එන්න කියනව තිලකට මේ පැත්තෙ, ඔය කරපු කියපු කිසි දෙයක් අපි දන්න බවක් අඟවන්න ඕනෙ නෑ, බෙහෙත් කඩේ ආපහු දාල දෙන්න බැරුවයෑ. සාදාරනව කීයක් හරි හම්බකර ගන්න.""

සමුපකාරය වහන්නට පෙර යන්ට සැරසෙන ජේන්නෝනාට ලොකුහාමිනේ පැවසුවාය.

23 වන පිටෙන්

සාධුකාර දෙති. වරින් වර කෙනෙකු කහින සද්දය, අත පය එහෙ මෙහෙ හරවන සද්දය හැර වෙනත් සද්දයක් නැත.

කවුරු හෝ පැමිණ නිශ්ශබ්දතාවය බිඳ, බීඩි සද් දහයක හෝ තීරෝස් එකක් ඉල්ලන හඬට, මුදලාලි හෙමින් සැරේ නැගිට ගොස්, එම උවමනාව ඉටු කරන්නේ වැඩිය සද්ද ඇහෙන්නට කිසිවක් නො කියමින් ම ය.

සමහරක් දෙනා බණ අවසන්-වන තුරු ම වැඳ ගෙන සිටිති. එක දවසක් මම ද බණ අවසන් වනතුරු, වැඳ ගෙන සිටින්නෙමැ යි ආච්චිට ද කියා එසේ සිටීමට වෙර දැරුවද, ආච්චි පස්සා පැත්තට අත්ලෙන් ගසා ය මා අවදි කරවාගෙන ඇත්තේ. මාව වත්තම් කරගෙන පහළට බහින ආච්චි මට බැණ බැණ අනිත් අය සමග ධර්ම දේශනාවේ අනර්ඝත්වය ගැන සාකච්ඡා කරමින් යයි.

"හරි ෂෝක් බණ පොඩ්ඩ. අද බණ කීව හාමුරුවෝ නම්, බුදු වෙන්න පෙරුම් පුරන උත්තමයන් කෙනෙක් වෙන්නැති"

"මට බණ කියන කොට මතක් වුණෝ අපේ එයාව. කෝ කොච්චර කිව්වත්, ඔය මලඉලව් බීම නවත්තන්නෙ නෑනෙ."

"මට නම් මොකුත් තේරුන් නෑ."

"උඹට තේරෙන්නෙ කොහෙ-ාමද? උඹ පස්ස උඩ තියාගෙන නිදාගෙන නෙ හිටියෙ." මෙවැනි කථා මැද එක එක්කෙනා තම තමන්ගේ ගෙවල්වලට වැදී දොර වසා ගනිති.

AUSTRALIA SRI LANKA CATHOLIC ASSOCIATION Inc.
No 15 Mc Clelland St., Bell Park, Vic 3215
Tel: +61 (0) 3 5277 3620
Fax: +61 (0) 3 5277 1051
Email: sister@dodo.com.au
ABN: 47 423 510 982

### ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා කතෝලික සංගමය

### 2008 චතාරික වැඩසටහන් පිලිබඳ පූර්ව නිවේදනය

අප සංගමයේ ආරාධනය පරිදි සිංගල බසින් මෙවර චතාරික දේව මෙහෙයයන් සැමරීමට අම්පිටිය ජාතික දෙවසත්හලේ අධ්‍යක්ෂක ගරු ඇන්තනි ජයකොඩි පියතුමන් මාර්තු මස 12 වන දින මෙල්බර්න් නුවරට පැමිණීමට නියමිතය. එතුමන් සහභාගි වන වැඩසටහන් පිලිබඳ සියලු විස්තර ඉතා ඉක්මනින් දැනුම් දෙනු ලැබේ.

- **චතාරික ඝ්‍යානකාන්තිය**

සුපුරුදු පරිදි මහා සිකුරාදා සිට පාස්කු සඳුදා තෙක් Halls Gap හි දී චතාරික ඝ්‍යානකාන්තිය පැවැත්වේ. මේ සඳහා ඇත්තේ සීමිත ඉඩ ප්‍රමාණයක් බැවින් සහාභාගි වීමට බලාපොරොත්තු වන බැතිමතුන් හැකි ඉක්මනින් පහත සඳහන් අය අමතන්න.
කැලිස්ටස් 04 2587 9546 ශිරෝමා 8790 2158

- **පසන් ගීත සන්ධ්‍යාව**

පාරම්පරික ශ්‍රී ලාංකික පසන් ගීත ගායනා සමගින් ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය මෙනෙහි කෙරෙන යාඥාමය සන්ධ්‍යාවක් 2008 මාර්තු මස 10 වන දින Hawthorn හි ශු. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ දී (Mel. Ref. 45 B 11) සවස 6.00 ට පැවැත්වේ. අලංකාර පසන් ගායනා ඇතුළත් මෙම දුර්ලබ අවස්ථාවට සහභාගි වන ලෙස බැතිමත් සැමට ගෞරවයෙන් ආරාධනා කරමු.
විමසීම්: ශේනක පෙරේරා 9801 4356 සුසංග කොස්තා 04 3378 6787

- **සිංහල බසින් පැවැත්වෙන දිව්‍ය යාගය**

ගරු ශාන්ති අබේසිංහ පියතුමන් විසින් සිංහල බසින් සිදුකෙරෙන දිව්‍ය යාගයක් 2008 පෙබරවාරි මස 24 වන දින සවස 7.15 ට St. Elizabeth's Catholic Church, No. 111, Bakers Road, Dandenong North හි දී පැවැත්වේ. (Mel. Ref. 81 A 8)

විමසීම්: සුසංග කොස්තා 04 3378 6787 ශිරෝමා ප්‍රනාන්දු 8790 2158

චතාරික වැඩසටහන් පිලිබඳ සියළු විස්තර සඳහා ගරු කන්සෙප්ටා කන්‍යාසොහොයුරිය 5277 3620 හෝ නිර්මලාල් ඩයස් 9808 4139 අමතන්න.